වාවකච්චේරි නගර සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 23 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 24 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට වාවකච්චේරි නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) විදුලි ක්‍රියාකාරකම් විදුලිබල මණ්ඩල වෙත පවරා තිබුණද, විදුලි ගබඩා තොග රු. 241,156 ගබඩා තොගයෙන් අඩුකර නොතිබීමෙන් ගබඩා තොග වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) රු. 16,375,000 ක් වටිනා වාහන 13 ක අයිතිය පවරා ගැනීමට කටයුතු නොකර වටිනාකම් තක්සේරුකර ගිණුම්ගතකර තිබීමෙන් මොටර් වාහනවල වටිනාකම් රු. 16,375,000 කින් ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) නැවත අයකර ගන්නා ලද රු. 436,050 ක මුදල ආදායමට මාරුකර නොතිබීමෙන් ආදායම් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3 ලේඛන හා පොත්පත් නොපැවැත්වීම
--------------------------------------------------

සභාවේ ඉඩම් විකුණුම් බදු ලේඛනය සමාලෝචිත වර්ෂයේදී පවත්වා නොතිබුණි.

1.3.4 ලැබියයුතු ගිණුම්
-------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 105,640 ක හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රු. 838,802 ක රැඳවුම් මුදල් අදාල කොන්ත්‍රාත්කරු වෙත ගෙවා නොතිබුණි.

1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

---

පහත දැක්වෙන අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| නගර සභා ආඥා පනත 44(2) වගන්තිය | සභාවේ මාර්ග පිළිබඳ ලැයිස්තු පිළියෙල කර රජයේ ගැසට්පත්‍රයේ පළකර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

---

2.1 මූල්‍ය ප්‍රතිඵලය

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 38,737,070 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදමට වඩා වැඩිවූ ආදායම රු. 32,567,828 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 6,169,242 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය ශුද්ධ අතිරික්තය රු 4,906,330 ක් වූ අතර එයට අනුකූලව ඉකුත් වර්ෂයේ ක්‍රියාකාරකම්වල ශුද්ධ අතිරික්තය රු. 25,393,636 ක් විය. මෙය සමාලෝචිත වර්ෂයේ අවසාන මූල්‍ය ප්‍රතිඵලය රු. 20,487,306 කින් පහත වැටීමක් පෙන්නුම් කෙරුණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

---

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ කාරක ප්‍රාග්ධනය රු. 105,438,065 ක්වූ අතර එයට අනුකූලව ඉකුත් වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 81,331,735 ක් වී තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 24,106,330 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.4 ආදායම් පරිපාලනය

---

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

---

ලේකම් විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2016 ඇස්තමේන්තුගත | 2016 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 6,551 | 7,491 | 10,218 |
| බදු කුලී | 25,925 | 23,903 | 1,184 |
| බලපත්‍ර ගාස්තු | 768 | 805 | 74 |
| වෙනත් ආදායම් | 63,662 | 66,775 | 59,638 |
| එකතුව | 96,906 | 98,974 | 71,114 |

2.4.2 වරිපනම්

----------

රු. 8,304,975 ක වරිපනම් බදු මෙතෙක් අයකර නොතිබුණි.

2.4.3 බදු කුලි

---------

රු. 63,700 ක කඩකුලි සභාව විසින් මෙතෙක් අයකර ගෙන නොතිබුණි.

2.4.4 බලපත්‍ර ගාස්තු

----------------

රු. 74,400 ක බලපත්‍ර ගාස්තු සභාව විසින් මෙතෙක් අයකර ගෙන නොතිබුණි.

2.4.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ මුදල් රු. 2,797,000 ක මුදල සභාව විසින් මෙතෙක් අයකර ගෙන නොතිබුණි.

(ආ) ඉඩම් රෙජිස්ටාර් ජනරාල්වරයාගෙන් අයවියයුතු මුද්දර ගාස්තු රු. 48,026,181 ක් අයකර ගෙන නොතිබුණි.

2.5 අධි ගාස්තු

------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සේවක භාරකාර අරමුදලේ දායක මුදල් අදාල කාලවල ප්‍රේෂණය කර නොතිබීමෙන් රු. 72,039 ක දඩ මුදලක් ගෙවා තිබුණි. නිලධාරින්ගේ අනවධානය හේතුවෙන් ගෙවීමට සිදුවූ දඩ මුදල් අදාල නිලධාරින් ගෙන් අයකර ගෙන නොතිබුණි.

(ආ) සේවක භාරකාර අරමුදලේ අංක ලබා නොතිබූ සේවකයන්ගේ දායක මුදල් රු. 49,026 ක මුදල අදාල සේවකයාට ආපසු නොගෙවා ආදායමට මාරුකර තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගෙවිය යුතු වැටුප් රු. 111,734 ක් අදාල අය වෙත නොගෙවා කපා හැර තිබුණි.

(ආ) රු. 1,271,910 ක නාගරික සංවර්ධන අධිකාරයේ තැන්පත් මුදල් අදාල අරමුණ සඳහා යොදවා ගෙන නොතිබුණි.

(ඇ) සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 107 ක්වූවද තත්‍ය සේවක සංඛ්‍යාව 93 කි. ඒ අනුව සේවක පුරප්පාඩු 16 කි. අතිරික්ත සේවක සංඛ්‍යාව 02 ක්ද තිබුණි.

3.2 ඌන උපයෝජිත වත්කම්

------------------------------

සභාව සතු වාහන 2 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

3.3 අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------

පිළිසරු වැඩසටහන යටතේ ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණද අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කර නොතිබුණි.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
----------------------------------------
අයවැය පාලනය
-----------------
වියදම් ව්‍යුහය
----------------
අයවැයගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු. 36,088 සිට රු. 9,849,354 දක්වා වියදම් විචලනයක් පැවතුනු බව විගණනයේදී නිරීක්ෂණය විය.